කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : 03_SP WWL /19/07/18/03_SP
වර්ණය : රතු

# තද සුළං සහ රළු මුහුදු ප්‍රදේශ පිළිබඳව අනතුරු ඇඟවීමේ නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2019 ජුලි මස 19 වන දින ප.ව. 09.00 වන තෙක් වලංගු වන පරිදි
2019 ජුලි මස 18 වන දින ප.ව. 09.00 ට නිකුත් කරන ලදී.

## සැලකිලිමත් වන්න!

දිවයින හරහා, විශේෂයෙන් දිවයිනේ නිරිත දිග කොටසේ සහ මධ්‍යම කඳුකර ප්‍රදේශවල දැනට පවතින සුළං තත්ත්වයේ වැඩිවීම ඉදිරි පැය 24 තුළදී තවදුරටත් බලාපොරොත්තුවේ.

<u>ගොඩබිම් ප්‍රදේශ සඳහා</u>

බස්නාහිර, දකුණු, මධ්‍යම, සබරගමුව, වයඹ සහ උතුරු-මැද පළාත්වලත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේත් විටින් විට හමන පැ.කි.මී. (70-80) පමණ දක්වා ඉතා තද සුළං ද, සෙසු ප්‍රදේශවල විටින් විට හමන පැ.කි.මී. (50-60) පමණ දක්වා තද සුළං ද ඇති විය හැක.



කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology
TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

# මන්නාරම සිට පුත්තලම, කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශ සදහා

මන්නාරම සිට පුත්තලම, කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. (80-90) දක්වා වැඩි විය හැකි අතර මෙම මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු වේ.

මෙම මුහුදු ප්‍රදේශය තුල 2019 ජුලි 20 වන දින සවස් කාලය දක්වා ධීවර කටයුතු වල නොයෙදෙන ලෙස ධීවර ප්‍රජාවට අවවාද කරන අතර නාවුක ප්‍රජාව මේ පිලිබදව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.




## සිදුවිය හැකි හානි

- තාවකාලික නිවාසවලට තරමක හානි සිදුවිය හැකි අතර, මුදුන් වහළ සහ ශක්තිමත්ව සවි නොකළ තහඩු වැනි දෑ සුළඟට ගසාගෙන යා හැක.
- ගස්වල අතු කැඩීම් සහ මාර්ග අසල ඇති විශාල ගස් ගැලවී යා හැක.
- මුහුදු ජලය වෙරළාසන්න පහත් ගොඩබිම් ප්‍රදේශ කරා පැමිණිය හැක

## අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග

- කඳුකර සහ මුහුදුබඩ ප්‍රදේශ වල මාර්ග භාවිත කරන්නන් සහ රථ වාහන පදවන්නන් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න.
- වෙරල ආසන්න තාවකාලික නිවාසවල පදිංචිකරුවන් විශේෂ අවධානයෙන් කටයුතු කිරීම .
- කඩාවැටෙන ගස්වලින් සහ විදුලි රැහැන් වලින් ආරක්ෂාවීම.
- හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් ගේ සහය පතන්න.